# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2134/56 - 2019 අගෝස්තු මස 02 වැනි සිකුරාදා - 2019.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

L.D.B. 5/1991

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත**

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 5(ඊ) වගන්තිය සමග කියවිය යුතු 71(2)(අ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් සාදනු ලබන රෙගුලාසි.

මෛත්‍රීපාල සිරිසේන,<br>
ජනාධිපති.

2019 ජූලි මස 19 වැනි දින,<br>
කොළඹ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2019 අංක 01 දරන ග්‍රාහක සිම් කාඩ්පත් (ග්‍රාහක අනන්‍යතා මොඩියුල - SIM) ලියාපදිංචි කිරීමේ රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙම රෙගුලාසි ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද දින සිට බලපැවැත්වේ.

2. මෙම රෙගුලාසි ඩිජිටල් සෙලියුලර් ජංගම සේවා සැපයීම පිණිස පනතේ 17(2) වගන්තිය යටතේ බලපත්‍රලාභී සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා අදාල වේ.

3. සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පිළිවෙලින් සිල්ලර සහ ආයතනික ග්‍රාහකයින්ගේ සිම් කාඩ්පත් ලියාපදිංචි කිරීම සඳහා, මෙහි උපලේඛන 1 සහ 2 හි සඳහන් කර ඇති පරිදි නියාමන පියවරවල් පිළිපැදිය යුතු ය.

4. සියලුම දුරකථන ක්‍රියාකරු සමාගාම් විසින් මෙහි 1 සහ 2 උපලේඛනයේ සඳහන් කර ඇති නියාමන පියවරවල් ක්‍රියාත්මක කිරීම සඳහා එම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පිළිගත් පටිපාටියේ විස්තර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (මෙහි මින් මතු ශ්‍රී. ල. වි. ස. නි. කො. සභාව යනුවෙන් හඳුන්වන) වෙත ඉදිරිපත් කළ යුතු ය.

1A - PG 4606 — 517 (2019/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. ශ්‍රී. ල. වි. ස. නි. කො. සභාව, මෙම රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක කිරීම පිණිස ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා කලින් කල නියමයන් නිකුත් කරනු ලැබිය හැකිය.

6. මෙම රෙගුලාසි වල පද සම්බන්ධයෙන් ;

''පනත'' යන්නෙන් 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත අදහස් වේ ;

''ආයතනික ග්‍රාහකයා'' යන්නෙන් සිය සේවකයන්, නියෝජිතයන් හෝ කිසියම් වෙනත් බලයලත් තැනැත්තෙකුගේ භාවිතා කිරීම සඳහා ජංගම දුරකථන ක්‍රියාකරු සමාගමක සිය සමාගමේ නම යටතේ සිම් කාඩ්පත් ලියාපදිංචි කර ගන්නා ලද කිසියම් තැනැත්තෙකු අදහස් වේ.

''පුද්ගලයා'' යන්නෙන් සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද ආයතනයක් අදහස් වේ ;

''සිල්ලර ග්‍රාහකයා'' යන්නෙන් ජංගම දුරකථන ක්‍රියාකාර සමාගමක සිය පෞද්ගලික නම යටතේ සිම් කාඩ්පත ලියාපදිංචි කර ගන්නා ලද කිසියම් තැනැත්තෙකු අදහස් වේ;

''සිම්'' යන්නෙන් ග්‍රාහක අනන්‍යතා මොඩියුල අදහස් වේ

''සිම් කාඩ්පත් ''යන්නෙන් ග්‍රාහක අනන්‍යතා මොඩියුල වලින් සමන්විත ග්‍රාහකයකු සඳහා නිකුත් කළ කාඩ්පත හෝ චිපය අදහස් වේ.

*(රෙගුලාසි 2 )*

## උපලේඛනය I

### *සිල්ලර ග්‍රාහකයන් ලියාපදිංචි කිරීම*

සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් සිල්ලර ග්‍රාහක සිම් කාඩ්පත් ලියාපදිංචි කිරීමේදී පහත සඳහන් නියාමන පියවරවල් පිළිපැදිය යුතු ය.

1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද අයදුම්පත්‍රය සිල්ලර ග්‍රාහකයාගෙන් ලබා ගත යුතු ය. (ජාතික හැඳුනුම්පත් අංකය, ස්ථිර ලිපිනය, වර්තමාන ලිපිනය සහ නව දුරකථන අංකය පිළිබඳ තොරතුරු අවශ්‍ය වේ)

2. 1 වන පරිච්ඡේදයේ සඳහන් කරන ලද අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු ය :-

   (අ) ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ හෝ වලංගු ගුවන් ගමන් බලපත්‍රයේ ග්‍රාහකයා විසින් නිසි පරිදි අත්සන් කරන ලද ඡායා පිටපතක්;

   (ආ) ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ හෝ වලංගු ගුවන් ගමන් බලපත්‍රයේ සිල්ලර ග්‍රාහකයාගේ ඡායාරූපය අපැහැදිලි අවස්ථා වලදී සිල්ලර ග්‍රාහකයා ඔහුගේ/ඇයගේ අත්සන සහිතව ඉදිරිපත් කරන ඡායාරූපයක්

3. (අ) ජාතික හැඳුනුම්පතේ ලිපිනය ස්ථිර ලිපිනය ලෙස සැලකිය යුතු ය.

   (ආ) සිල්ලර ග්‍රාහකයාගේ වර්තමාන ලිපිනය ජාතික හැඳුනුම්පතේ ලිපිනයට වෙනස් අවස්ථාව වලදී හෝ ජාතික හැඳුනුම්පත වෙනුවට රියදුරු බලපත්‍රය හෝ විදේශ ගුවන් ගමන් බලපත්‍රය පිළිගන්නා අවස්ථා වලදී, සිල්ලර ග්‍රාහකයා විසින් සිය ලිපිනය සනාථ කිරීම පිණිස බිල්පත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

4. සිම්පත සක්‍රීය කිරීමට පෙර සිල්ලර ග්‍රාහකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය දුරකථන ක්‍රියාකරු සමාගමේ දත්ත සමුදාය පිළිබඳ ගොනුවට (database) හෝ ජාලයට ඇතුළත් කළ යුතු ය.

5. 1, 2 සහ 3 අයිතමවල ලැයිස්තුගත කරන ලද ලියකියවිලිවල ස්කෑන් කරන ලද පිටපත් සිම් කාඩ්පත සක්‍රීය කර මාසයක් ඇතුළත හෝ බලයලත් නිලධාරියා ඉල්ලා සිටින විට දුරකථන ක්‍රියාකරු සමාගමේ දත්ත සමුදාය පිළිබඳ ගොනුවට (database) හෝ ජාලයට අප්පතනය කිරීම (uploaded) සිදු කළ යුතු ය.

6. 1, 2 සහ 3 පරිච්ඡේදවල සඳහන් කරන ලද ග්‍රාහකයන් පිළිබඳ තොරතුරු 5 පරිච්ඡේදය ප්‍රකාරව කලින් කල යාවත්කාලීන කළ යුතු අතර බලයලත් නිලධාරියකුට එම තොරතුරු අවශ්‍ය වූ විට ඒවා ඉදිරිපත් කළ යුතු ය.

7. ශ්‍රී. ල. වි. ස. නි. කො. සභාවට ග්‍රාහකයකුගේ තොරතුරු හෝ දත්ත ලබාගැනීමට අවශ්‍ය වූ විට සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් දත්ත සමුදාය පිළිබඳ ගොනුවට හෝ ජාලයට ප්‍රවේශය සැපයීම අවශ්‍ය වේ.

8. සිම් කාඩ්පත සක්‍රීය කළ දින සිට මාසයක් ඇතුළත 5 වන පරිච්ඡේදයේ සඳහන් කරන ලද උපදෙස් පිළි නොපදින්නේනම්, සියළුම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් දුරකථන සම්බන්ධතාවය විසන්ධි කිරීම අවශ්‍ය වේ.

*(රෙගුලාසි 2 )*

## උපලේඛනය II

### *ආයතනික ග්‍රාහකයන් ලියාපදිංචි කිරීම*

සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් ආයතනික ග්‍රාහක සිම් කාඩ්පත් ලියපදිංචි කිරීමේදී පහත සඳහන් නියාමන පියවරවල් පිළිපැදිය යුතු ය.

1. ආයතනික ග්‍රාහකයෙකුගේ බලයලත් නිලධාරියකු විසින් නිසි පරිදි අත්සන් කරන ලද ආයතනික පැකේජයක් යටතේ නව දුරකථන ආයතනික ගිණුමක් සඳහා ආයතනික ග්‍රාහක සිම් කාඩ්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන්නන්ගෙන් අයදුම්පත්‍රයක් හෝ ගිවිසුමක් ලබා ගත යුතු ය.

2. 1 වන පරිච්ඡේදයේ සඳහන් කරන ලද අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු ය :-

   (අ) ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සත්‍ය පිටපතක් ;

   (ආ) ආයතනික පැකේජය යටතේ සම්බන්ධතාවය ලබාගන්නා ආයතනික ග්‍රාහකයාගේ නම, ජාතික හැඳුනුම්ත් අංකය හෝ රියදුරු බලපත්‍රයේ අංකය හෝ වලංගු ගුවන් ගමන් බලපත්‍රයේ අංකය, ස්ථිර ලිපිනය සහ වර්තමාන ලිපිනය පිළිබඳ විස්තර.

3. ආයතනික ග්‍රාහක සිම් කාඩ්පත සක්‍රීය කිරීමට පෙර ආයතනික ග්‍රාහකයාගේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය දුරකථන ක්‍රියාකරු සමාගමේ දත්ත සමුදාය පිළිබඳ ගොනුවට (database) හෝ ජාලයට ඇතුළත් කළ යුතු ය.

4. සිම් කාඩ්පත සක්‍රීය කර මාසයක් ඇතුළත හෝ බලයලත් නිලධාරියා ඉල්ලා සිටින විට අයිතම 1, 2 සහ 3 යටතේ ලැයිස්තුගත කරන ලද ලියකියවිලිවල ස්කෑන් කරන ලද පිටපත් දූකරථන ක්‍රියාකරු සමාගමේ දත්ත සමුදාය පිළිබඳ ගොනුවට (database) හෝ ජාලයට අත්පතනය කිරීම (uploaded) සිදු කළ යුතු ය.

5. සිම් කාඩ්පතක් භාවිතා කරන ආයතනික ග්‍රාහකයකු ලියාපදිංචි කරන ලද ව්‍යාපාරික ආයතනය හැරදමා ගිය අවස්ථා වලදී ආයතනික පැකේජය යටතේ පවත්නා සම්බන්ධතාවය විසන්ධි කළ යුතු ය.

6. ආයතනික පැකේජය යටතේ සිටින ආයතනික ග්‍රාහකයෙකුගේ තොරතුරු 4 පරිච්ඡේදය ප්‍රකාරව කලින් කල යාවත්කාලීන කළ යුතු අතර බලයලත් නිලධාරියකුට එම තොරතුරු අවශ්‍ය වූ විට ඒවා ඉදිරිපත් කළ යුතු ය.

7. ශ්‍රී. ල. වි. ස. නි. කො. සභාවට ග්‍රාහකයෙකුගේ තොරතුරු හෝ දත්ත ලබාගැනීමට අවශ්‍ය වූ විට සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් දත්ත සමුදාය පිළිබඳ ගොනුවට හෝ ජාලයට ප්‍රවේශය සැපයීම අවශ්‍ය වේ.

8. 4 වන පරිච්ඡේදයේ සඳහන් කරන ලද උපදෙස් සිම් කාඩ්පත සක්‍රීය කළ දින සිට මාසයක් ඇතුළත පිළි නොපදින්නේනම්, සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් දුරකථන සම්බන්ධතාවය විසන්ධි කිරීම අවශ්‍ය වේ.

08 - 655

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.